# මිරිදිය ධීවර වර්ධනය

පුද්ගලයන් 79,000 කට නොඅඩු සංඛ්‍යාවක් පූර්ණ කාලීනව සහ තවත් විශාල සංඛ්‍යාවක් අර්ධ කාලීනව නොයෙක් කාර්යයන්හි නියුතුව ඇති ධීවර කර්මාන්තයට මෙරට ආර්ථිකයෙහි සැලකිය යුතු ස්ථානයක් හිමිවේ. ධීවර කර්මාන්තයෙහි විවිධ අංශ ලබා ඇති ප්‍රගතිය පිළිබඳව විමර්ශනය කිරීමේදී මෑතක් වනතෙක්ම මිරිදිය ධීවර කර්මාන්තය මුහුදුබඩ ධීවර කර්මාන්තය මෙන් අවධානයට ලක්කලයුතු තරම් මහත් ප්‍රගතියක් අත්කරගෙන නොතිබූ බව පෙනී යයි. එසේ වුවද මේ අංශය දියුණු කිරීම සඳහා රජය යම් යම් විවිධ පියවර ගෙන ඇති අතර එහි බලපෑම පැහැදිලිවම දක්නට ලැබේ. විශේෂයෙන්ම පසුගිය වසර කීපය තුලදී මෙහි විශාල දියුණුවක් ඇතිවී තිබේ. මෙම ලිපියෙන් සාකච්ඡාවට ලක් කරනු ලබන්නේ මෙරට මිරිදිය ධීවර කර්මාන්තය පියවරෙන් පියවර දියුණුව කරා පා නැගූ අන්දමයි.

වැව් ඇල දොළ ගංගා වලින් සපිරි මෙරට වැසියන් ආර්ථික කටයුත්තක් වශයෙන් නොවූවත් එදිනෙදා ආහාරයට මසුන් සපයා ගැනීම සඳහා ඈත අතීතයේ සිටම මෙහි නිරත වූ බවට සාක්ෂි තිබේ. ක්‍රි.පූ. දෙවැනි ශත වර්ෂයේදී ලියැවුනු පෙරියන්කුලම් ශිලාලේඛනය සහ ක්‍රි.පූ. තුන්වැනි ශත වර්ෂයේදී ලියැවුනු සමන්තපාසාදික වෙහිද මිරිදිය ධීවර කටයුතු වල යෙදුනු පුද්ගලයන් පිළිබඳව සඳහන් වේ. අද මෙන් නවීන පන්නයේ දැල් හා අනෙකුත් ආම්පන්න නොතිබූ ඈත කාලයේ "කෙමන" වැනි උපකරණ පාවිච්චි කර ජලමාර්ග අවහිර කිරීමෙන් හා වෙනත් ආකාර වලින් මසුන් අල්ලා ගන්නට ඇතැයි සිතිය හැකිය. පොදුවේ සම්පත් බෙදා හදා ගැනීමට පුරුදුව සිටි පුරාණ ශ්‍රී ලාංකිකයෝ ගම්වැව් ඉදිකිරීමෙන් ලබාගත් මාළු එම වැව් වලින් පෝෂිත කුඹුරු අයිතිකරුවන් අතර පොදුවේ බෙදා ගත්හ. එනිසා ආර්ථිකමය කටයුත්තකට වඩා පාරිභෝගික අවශ්‍යතා සපුරා ගැනීමේ අභිප්‍රායෙන් මිරිදිය ධීවර සම්පත් භාවිතා කර ඇති බව පෙනේ.

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි

**දයානන්ද චන්ද්‍රසිරි**

**විසිනි**

එතරම් දියුණු තත්ත්වයක නොතිබූ මිරිදිය ධීවර කටයුතු කෙරෙහි රජය කෙලින්ම මැදිහත් වූයේ 1900 දී පමණය. රටතුල පිහිටි ජලාශයන් වෙත අළුත් මසුන් වර්ග හඳුන්වා දීම තුලින් රජයේ මැදිහත් වීම ඇරඹුනි. 1908 දී මිරිදිය මසුන් විශේෂයක් වූ එට්රෝපලස් බෝ කිරීම සඳහා කළුතර ප්‍රදේශයේ ටැංකි තනා පර්යේෂණ ආරම්භ කළ නමුත් එය අසාර්ථක විය. නැවත 1928 හා 1932 වර්ෂ වලදී කිවුල් දිය මසුන් මිරිදිය ජලය මිශ්‍ර පොකුණු වලට දමා ඇති කිරීම සඳහා උත්සාහයක් දරන ලදී.

පිටරටින් ගෙන්වන ලද මසුන් වර්ග හඳුන්වා දීමේ වැඩ පිළිවෙලෙහි ඊළඟ වැදගත් අවස්ථාව වූයේ 1951 වර්ෂයයි. මෙම වර්ෂයේදී තිලාපියා මසුන් සෑහෙන ප්‍රමාණයක් ගෙන්වා බෝ කර වියලි කලාපයේ ජලාශයන් විශාල ප්‍රමාණයකට හඳුන්වා දෙන ලදී. මෙසේ හඳුන්වා දීමත් සමග තිලාපියා මොසැම්බිකා දිවයිනේ අභ්‍යන්තර ජලාශයන්හි පොදු මාළුවෙක් බවට පත්විය. එපමණක් නොව මේ සමගම මිරිදිය ධීවර කර්මාන්තයේ වේගවත් වර්ධනයක් ඇරඹුනි. මේ නිසා කලින් තිබූ නාක් මෙන් පාරිභෝගික කටයුත්තකට වඩා ආර්ථිකමය වශයෙන් මෙහි ඇති වැදගත්කම ඉස්මතු විනි. අභ්‍යන්තර ජලාශයන්හි වේගයෙන් වර්ධනය වූ මිරිදිය මත්ස්‍ය සම්පත් නිසා මුහුදු ධීවරයෝ තමන්ට මුහුදේ රැකියාව කළ නොහැකි කාල වලදී මින්නේරිය, පරාක්‍රම සමුද්‍රය වැනි විශාල ජලාශ වෙත සංක්‍රමනය වීමට පටන් ගත්හ. කෙසේ වුවත් මේ තුලින් විශාල අභ්‍යන්තර ජලාශයන්හි මිරිදිය ධීවර කර්මාන්තය සඳහා ස්ථිර අඩිතාලමක් වැටුනි.

තිලාපියා මොසැම්බිකා වර්ගයේ මසුන් අළුතෙන් හඳුන්වාදීම නිසා මිරිදිය ධීවර කර්මාන්තය ආර්ථිකමය වශයෙන් වටිනා එලදායි කාර්යයක් බවට පත්වූවා පමණක් නොව මිරිදිය ජලාශයන්ගෙන් ලැබෙන මත්ස්‍ය නිෂ්පාදන ප්‍රමාණයද ඉහල ගියේය. උදාහරණ වශයෙන් 1957 දී පරාක්‍රම සමුද්‍රයෙන් වසරකට ලැබෙන මත්ස්‍ය ප්‍රමාණය අක්කරයකට රාත්තල 41 ක් වූ අතර 1962 වනවිට එය 117 දක්වා වේගයෙන් ඉහළ ගියේය. නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක්ද තිලාපියා මොසැම්බිකා මසුන් විය.

1960 දී නැවතත් ගුරාමි, තිලාපියා සහ කෘෂි වැනි පිටරටින් ගෙන එන ලද මත්ස්‍ය වර්ග හඳුන්වා දෙන ලදී. 1974 දී චීන විශේෂඥයෝ ග්‍රාස්කාප්, බිග්හෙඩ් කාප් ආප් අභ්‍යන්තර ජලාශයන් වෙත හඳුන්වා දුන්හ. මෙසේ වරින් වර ජලාශයන් තුල මසුන් තැන්පත් කිරීම අභ්‍යන්තර ජලාශ යන්ගෙන් ලැබෙන මසුන් ප්‍රමාණය වැඩි කිරීමට බෙහෙවින් ඉවහල් විය.

1970 ගනන් වලදී මිරිදිය මත්ස්‍ය කටයුතු කෙරෙහි රජය සැහෙන අවධානයක් යොමු කළ අතර ඒ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් ආයෝජනය කළේය. 1972 දී රු. 1,30,043 ක මුදලක්ද 1974 දී රු. 1,05,817 ක මුදලක්ද මේ සඳහා ආයෝජනය කර ඇත. 1973 දී රජය විසින් ටොන් 7000 සිට 1976 වන විට ටොන් 47,000 දක්වා මිරිදිය මාළු නිෂ්පාදනය වැඩි කිරීම සඳහා තුන් අවුරුදු කඩිනම් යෝජනා ක්‍රමයක් සකස් කරන ලදී. මෙම වැඩ පිළිවෙල යටතේ මිරිදිය මත්ස්‍ය මධ්‍යස්ථාන නවයක් සහ චීන ආධාර යටතේ මිරිදිය මසුන් අභිජනනය කිරීමේ මධ්‍යස්ථාන යක් පිහිටුවන ලදී.

මේ අංශයෙහි වඩාත් ඉදිරි පියවරක් වූයේ 1979 මිරිදිය ධීවර කටයුතු සඳහා ධීවර අමාත්‍යාංශය තුල වෙනම අංශයක් පිහිටුවීමයි. මෙම අංශයට භාරවූ කටයුතු අතර අභිජනනය කරන ලද මසුන් සැපයීම හා ඒවා අභ්‍යන්තර ජලාශයන්හි තැන්පත් කිරීම සහ වැඩි වැඩියෙන් මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සඳහා ජනතාව පෙළඹවීම වේ. මෙම අංශය පිහිටුවීමට ප්‍රථම මිරිදිය අංශය සඳහා වූ කටයුතුද ධීවර අමාත්‍යාංශයේම කොටසක් විය.

මෙරට මිරිදිය ධීවර කර්මාන්ත යේ විශාල දියුණුවක් ඇතිවූ මීළඟ අවධිය වූයේ ධීවර මහා සැලැස්ම (1979–83) ක්‍රියාවට පත්වූ කාල සීමාවයි. ධීවර මහා සැලැස්ම විසින් මේ මගින් අත්කර ගත හැකි ඉහල දියුණුව නිසා මේ උප අංශය කෙරෙහි සැහෙන අවධානයක් යොමු කර ඇත. අනෙක් කරුණ නම් පවත්නා වර්ධනයේ ස්වභාවය අනුව 1983 වන විට මුහුදු අංශයේ වෙරළබඩ ප්‍රදේශ වලින් අත්කර ගත හැකි උපරිම නිෂ්පාදන ප්‍රමාණය කරා ළඟා වන අතර අඩු වියදමකින් මාළු නිෂ්පාදනය වැඩි කිරීම සඳහා 1983න් පසුව ඉවහල් කර ගත හැකි හොඳම මාර්ගය මිරිදිය අංශය වීමයි.

ධීවර මහා සැලැස්ම මගින් මිරිදිය ධීවර අංශයෙන් 1983 වන විට සපුරා ගැනීමට බලාපොරොත්තු වූ නිෂ්පාදන ඉලක්කය ටොන් 50,000 විය. මෙම ඉලක්කය වෙත පැමිණීම සඳහා සැලැස්ම මගින් යොදන ලද උපාය මාර්ගයන් අතර පවත්නා මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම හා වඩ වඩාත් පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම තුලින් අභ්‍යන්තර ජලාශයන්හි මත්ස්‍ය සම්පත් සුලභ කිරීම පුහුණු, ව්‍යාප්ති හා වෙළඳාම වැඩි දියුණු කිරීම සඳහා පියවර ගැනීම ආදිය වැදගත් වේ. මත්ස්‍ය නිෂ්පාදනය සඳහා ධීවරයින්ම දිරි ගැන්වීම සඳහා 90 % සහනාධාරය යටතේ ෆයිබර් ඔරු විශාල ප්‍රමාණයක් බෙද දීමටද කටයුතු සල සන ලදී. එම කටයුතු වලට අමතර සහනාධාර වැඩ පිළිවෙලක් යටතේ ගෘහ කර්මාන්තයක් වශයෙන් පොකුණු වල මසුන් ඇතිකිරීම සඳහා ජනතාව දිරිගැන්වීමට පියවර ගෙන ඇත.

මිරිදිය ධීවර කටයුතු කෙරෙහි ධීවර මහා සැලැස්ම මගින් දක්වන ලද ප්‍රමුඛත්වය නිසා පසුගිය වසර කීපය තුලදී ඒ තුල විශාල ප්‍රගතියක් සිදුවී ඇතිවාට කිසිදු සැකයක් නො මැත. ප්‍රධාන වශයෙන්ම නිෂ්පාදන යෙහි විශාල වැඩි වීමක් පෙන්නුම් කරයි. 1978 දී ටොන් 16,400 ක් මිරිදිය මාළු නිෂ්පාදනය 1983 වන විට ටොන් 35,500 දක්වා ඉහල යන ලදී. ඒ අනුව මෙම වසර පහ තුලදී 116.4%ක නිෂ්පාදනයේ ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. අද මිරිදිය අංශයෙන් නිපදවන මාළු ප්‍රමාණය දේශීය මාළු නිෂ්පාදිත යෙන් 15% ක් පමණ වේ. මේ මට්ටමට පැමිණුම සඳහා කලින් තිබූ ලී ඔරු සහ කෙප්පන් වැනි පැරණි යාත්‍රාත් බිලීපිති හා විසිදැල් වැනි පාරම්පරික ඇල්ලීමේ ක්‍රමත් වෙනුවට අළුතෙන් හඳුන්වා දුන් ෆයිබර් ඔරු හා කරමල් දැලත් බෙහෙවින් ඉවහල් වී තිබේ.

ධීවර මහා සැලැස්ම මගින් ඔරු ආදී ධීවර ආම්පන්න බෙද දී ඒ ඒ ජලාශ යටතේ ධීවර කටයුතු සං විධානය කිරීම නිසා ඔරු බෙද දෙන ලද සෑම ජලාශයකම වාගේ මසුන් ඇල්ලීම ජීවනෝපාය කරගත් එහෙත් එම ජලාශයන්ට ආසන්න ප්‍රදේශ වල පදිංචි පුද්ගල යන් පිරියක් දැකගත හැකිය. මීට කලින් මෙම ජලාශයන්හි එය වෘත්තීය කරගත පිරියක් සිටියත් ඔවුන් අතර ප්‍රමුඛ වූයේ සංක්‍රමණික මුහුදු ධීවරයින්ය.